# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2023.12.15 |


## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2023 නොවැම්බර්

### නිෂ්පාදන සහ සේවා අංශවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක 2023 නොවැම්බර් මාසයේ දී ඉහළ ගියේය

**2023 නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව දර්ශකාංක 57.0 ක් දක්වා ඉහළ යන ලද අතර, මෙමගින් සෑම වසරකම පාහේ උත්සව සමය තුළ ආර්ථික කටයුතු ඉහළ යෑම මගින් ඇතිවෙන බලපෑම පිළිඹිබු කෙරේ.** 2023 මාර්තු මාසයෙන් පසු ප්‍රථම වරට නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය මෙම මාසයේ දී කඩඉම් මට්ටම ඉක්මවා ගිය අතර, ඒ සඳහා සියලුම උප-දර්ශකවල දායකත්වය හේතු විය.

නව ඇණවුම් ඉහළ යෑම සඳහා ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශ ප්‍රධාන වශයෙන් දායක විය. තව ද, නිෂ්පාදන උප-දර්ශකයේ ඉහළ යෑම සඳහා ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය ඉහළ දායකත්වයක් දැක් වූ අතර, උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම මේ සඳහා හේතු විය. නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද පෙර මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී. එසේම, සැපයුම් බෙදාහැරීමේදී ඇති වූ කාර්යබහුලත්වය පිළිඹිබු කරමින්, නොවැම්බර් මාසයේ දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පෙර මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී.

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **49.5** | **57.0** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| **උප-දර්ශක** | | | | |
| නව ඇණවුම් | 50.5 | 60.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 49.5 | 59.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.5 | 51.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 52.5 | 59.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 49.5 | 51.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වූ අපේක්ෂාවන් යහපත් මට්ටමක පැවති අතර, ආර්ථික කටයුතු ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත් වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, 2024 ජනවාරි සිට බලපැවැත්වෙන බදු සංශෝධන හේතුවෙන් සිය කටයුතුවලට සිදුවන බලපෑම පිළිබඳව සමාගම් අවධාරණය කරන ලදී.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**2023 නොවැම්බර්**

**57.0**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5කින් ඉහළ යමින් 2023 නොවැම්බර් මාසයේ දී 49.3ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

චීනය, ඉන්දියාව, සහ සිංගප්පූරුව යන රටවල පසුගිය මාසයට සාපේක්ෂව 2023 නොවැම්බර් මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් වර්ධනය වූ අතර, රුසියාවේ එම අගය පෙර මාසයේ අගයෙහිම පැවතුණි. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 නොවැම්බර් මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 දෙසැම්බර් 14 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල්* (S&P Global) *ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා ක්‍රියාකාරකම්හි වේගවත් වර්ධනයක් පෙන්නුම් කරමින්, සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 නොවැම්බර් මාසයේ දී දර්ශකාංක 59.4ක් වාර්තා කළේය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම් හේතු විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**59.4**


**2023 නොවැම්බර්**

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, වෘත්තීය සේවා සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2023 නොවැම්බර් මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

බොහෝ උප අංශවල දක්නට ලැබුණු ධනාත්මක වර්ධනයත් සමඟ, 2023 නොවැම්බර් මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, සංචාරක පැමිණීම් ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් අනෙකුත් පෞද්ගලික ක්‍රියාකාරකම් හා නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබුණි. එමෙන්ම, මෑත කාලීනව සිදුකළ ප්‍රතිපත්ති පොලී අනුපාත පහළ දැමීම් හේතුවෙන් ඇති වූ ණය ඉල්ලුමේ ඉහළ යෑමට අනුකූලව මූල්‍ය සේවා අඛණ්ඩව වර්ධනය විය. මේ අතර, උත්සව සමයේ ලබා දෙන වට්ටම් මධ්‍යයේ තොග සහ සිල්ලර වෙළඳාම උප අංශය ද අඛණ්ඩව වර්ධනය විය.

සෘතුමය ඉල්ලුම සපුරාලීමට නව බඳවා ගැනීම් සිදු කරන ලද බැවින් සේවා නියුක්තිය 2023 නොවැම්බර් මාසයේ දී ඉහළ ගිය අතර, නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියේය.

සේවා අංශයෙහි
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ඔක්. | නොවැ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **56.2** | **59.4** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප-දර්ශක** | | |
| නව ව්‍යාපාර | 58.5 | 57.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.0 | 63.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 45.0 | 58.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.2 | 45.6 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 68.5 | 71.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 නොවැම්බර් මාසයේ දී 50.6ක් වාර්තා කළේය.

චීනය, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 නොවැම්බර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 දෙසැම්බර් 14 වන දිනට*

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් උත්සව සමය සහ සංචාරක සෘතුව හේතුවෙන් 2023 නොවැම්බර් මාසයේ දී අඛණ්ඩව ඉහළ ගියේය. කෙසේ වුවද, ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින්, 2024 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වීමට නියමිත එකතු කළ අගය මත බද්දට අදාළ සංශෝධන හේතුවෙන් ඇතිවන බලපෑම් පිළිබඳව අවධාරණය කරන ලදී.

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.